සැ. යු. - 2024.02.16 දින පළ කරන ලද අංක 2372 *ගැසට් පත්‍රයේ* III සහ IV(අ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,373 - 2024 පෙබරවාරි මස 22 වැනි බ්‍රහස්පතින්දා - 2024.02.22**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## IV(ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... | 238 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 242 |


### සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12 00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට්* පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2024 මාර්තු 15 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2024 මාර්තු 01 වැනි දින දහවල් 12 00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පළාත් පාලන නිවේදන

## පේදුරුතුඩුව ප්‍රාදේශීය සභාව, පුලෝලි

බර වාහන යාම සඳහා තහනම

යාපනය පේදුරුතුඩුව වීදිය සිට මන්තිකයි මූලික රෝහල ඉදිරිපස හරහා මන්තිකයි, දුන්නාලයි, වීදිය දක්වා ඇති මීටර් 260.00 දුර රෝහල ඉදිරිපස වීදියේ බර වාහන යාමට තහනම් කර ඇති බව මෙයින් නිවේදනය කරමි.

ඒ. විනෝරාජ්,
ලේකම්.

පේදුරුතුඩුව ප්‍රාදේශීය සභාව.
පුලෝලි.

02-829

---

## මීගමුව මහා නගර සභාව

ගෝසාතක ආඥාපනතේ (272) වන අධිකාරිය යටතේ විරෝධතා කැඳවීම

මීගමුව මහා නගර සභාවේ බලතල ක්‍රියාත්මක කරන කාර්ය කර්තව්‍ය ඉටු කරන, මීගමුව මහා නගර සභාවේ නාගරික කොමසාරිස්, ඩබ්. ඒ. ඩී. ප්‍රභාත් ලක්ෂ්මන් වන මම මහා නගර සභා ආඥාපනතේ 286(අ) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2024 වර්ෂය සඳහා මෙහි පහත උපලේඛනයේ සඳහන් ස්ථානයන්හි ගව/එළු/මස් විකිණීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම සඳහා ඉල්ලීමක් මා වෙත ඉදිරිපත් කර ඇති බැවින්, එම බලපත්‍රය ලබා දීම පිණිස මීගමුව මහා නගර සභා බල ප්‍රදේශය තුළ පදිංචි හා ජීවත් වන අයවළුන් විරුද්ධ වන්නේ නම්, ඔහු හෝ ඇය එසේ විරුද්ධ වන්නේ කුමන හේතුවක් පදනම් කර ගෙනද යන්න පිළිබඳ විස්තර ලිඛිතව පිටපත් 02 කින් යුක්තව මෙම දැන්වීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (ආ) කොටසේ පළ වූ දා සිට, දින 14 ක් ඇතුළත ලියාපදිංචි තැපෑලෙන් නාගරික කොමසාරිස් නමට එවිය යුතු බව ගෝසාතක ආඥාපනතේ (272) වන අධිකාරිය 7(2) වගන්තිය යටතේ මම තීරණය කරමි.

ඩබ්. ඒ. ඩී. ප්‍රභාත් ලක්ෂ්මන්,
නාගරික කොමසාරිස්,
මහා නගර සභාව.
මීගමුව.

2024 පෙබරවාරි මස 14 වැනි දින,
මීගමුව මහා නගර සභා කාර්යාලයේ දී ය.

### උපලේඛනය

| | | |
|---|---|---|
| ඉල්ලුම්කරුගේ නම | - | එම්. එච්. එම්. නවාබු |
| මස් වෙළඳාම පවත්වාගෙන යාමට යෝජිත ස්ථානය | - | අංක 12/2, අන්නවි පටුමග, මීගමුව |
| වෙළඳාමේ ස්වභාවය | - | ගවමස් වෙළඳාම හා එළු මස් වෙළඳාම. |

02-793

---

## උඩුනුවර ප්‍රාදේශීය සභාව

ගෝසාතක ආඥාපනත (271 වැනි අධිකාරිය) යටතේ විරෝධතා කැඳවීම

මෙහි පහත දැක්වෙන විස්තර සඳහන් ස්ථානයන්හි ගවමස් වෙළඳාම් කිරීම සඳහා ඉල්ලුම්පත් ලැබී ඇත. ගවමස් වෙළඳාම් කිරීම සඳහා 2023 වර්ෂයට බලපත්‍ර ලබාදෙන ලෙසට ඉල්ලීම් කර ඇති බවට ගෝසාතක ආඥාපනත 7(2) වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

02. මෙම බලපත්‍ර ලබා දීමට විරෝධතාවයන් පවතී නම් උඩුනුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පදිංචි ඕනෑම අයෙකුට විරෝධතා ඉදිරිපත් කළ හැකිය. එම විරෝධතාවලට හේතු සහිතව පිටපත් 02 කින් යුක්ත ලියවිල්ලක් මෙම දැන්වීම *ගැසට්* පත්‍රයේ පළ වූ දින සිට දින 14 ක් (දින දහතරක්) ඇතුලත මා වෙත ඉදිරිපත් කරන ලෙසට මෙයින් කාරුණිකව දන්වමි.

| *නම හා ලිපිනය* | *වෙළඳ ස්ථානයේ ලිපිනය* | *වෙළඳාම් කරන මස් වර්ගය* |
|---|---|---|
| එම්. සාලි රොෂාන් අස්රෆ් මයා | අංක 16, කලුගමුව පාර, ගෙලිඔය | ගවමස් |

එස්. කේ. ගුණසේකර,
ලේකම්,
උඩුනුවර ප්‍රාදේශීය සභාව,
ගෙලිඔය.

2024 පෙබරවාරි මස 08 වැනි දින,
ගෙලිඔය.
උඩුනුවර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.
දු. ක. අ. 0812-310275

02-750

---

**රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව**

වෙන්දේසිය පිළිබඳ මහජන නිවේදනය

රුවන්වැල්ල ප්‍රාදේශීය සභා පනතේ 163(1) වගන්තිය යටතේ සිදු කෙරෙන වෙන්දේසියයි.

ප්‍රාදේශීය සභා පනතේ 163(1) වගන්තියේ විධිවිධාන යටතේ හිඟ වරිපනම් ගෙවීමට අසමත් වීම යන හේතුව මත රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව විසින් පහත විස්තර දක්වා ඇති දේපළ වෙන්දේසියේ විකුණනු ලැබේ.

1) දේපළ පිළිබඳ විස්තර :

| *දේපළ වර්ගය* | *කෙටි විස්තරය* | *අවම ලන්සුව* |
|---|---|---|
| රෙදි සෝදන යන්ත්‍රය | සිංගර් රෙදි සෝදන යන්ත්‍රය, ධාරිතාවය 6 kg | 15,000.00 |
| ශීතකරණය | සිසිල් තනි දොර ශීතකරණය | 15,000.00 |
| වේවැල් ඇඳි පුටු | ප්‍රමාණය 02 | 4,000.00 |
| කෑම මේස පුටු | ඇඳි රහිත ප්ලාස්ටික් පුටු - ප්‍රමාණය 03 | 2,400.00 |

2) වෙන්දේසිය පවත්වන දිනය හා වේලාව - **2024.02.28 (බදාදා) දින පෙ. ව. 11.00**

3) වෙන්දේසිය පවත්වන ස්ථානය - රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව

4) භාණ්ඩ පරීක්ෂා කර බැලීම - රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම්ගේ අනුමැතිය ඇතිව පරීක්ෂා කර බැලිය හැකිය.

5) ගෙවීම් පිළිබඳ කොන්දේසි හා නියමයන් -

මුදලින් පමණක් ගෙවීම් කළ යුතුය.

6) වෙන්දේසිය පිළිබඳ නියමයන් -

ගෙවීමට අදාළ නියමිත මුදල පියවීම සඳහා තක්සේරුවට ලක් වූ පුද්ගලයාට ඇති අයිතිය ලංසුව ලැබීමත් සමගින් අහෝසි වී යයි.

භාණ්ඩ මිලට ගැනීමට සමත් වූ ලංසුකරුවන් ගෙවීමේ නියමයන්ට අනුකූලව අදාළ ගෙවීම් සිදු කළ යුතුයි.

පී. පී. යූ. ජයවික්‍රම,
ලේකම් හා බලතල, කාර්ය, කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ ලේකම්,
රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව.

02-791

---

**කොටපොල ප්‍රාදේශීය සභාව**

දියුණු කළ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කිරීම

කොටපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පහත උපලේඛනයේ දක්වා ඇති ග්‍රාම නිලධාරි කොට්ඨාශවලින් සමන්විත ප්‍රදේශය 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) වගන්තිය ප්‍රකාරව, දියුණු කළ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කිරීම සඳහා 2023.03.29 දින 2023.03.29.18 දරන අයිතමය යටතේ කොටපොල ප්‍රාදේශීය සභා ලේකම් විසින් ගෙන ඇති තීරණය මා විසින් අනුමත කරන ලද බවත්, ඒ අනුව, පහත උපලේඛනය මගින් දක්වා ඇති ප්‍රදේශය 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) වගන්තිය ප්‍රකාරව දියුණු කළ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇති බවත් මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

චන්දන කේ. සෙනෙවිරත්න,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
මාතර.

**උපලේඛනය**

මොරවක් කෝරළේ තේ නිපදවන්නන්ගේ සමුපකාර සමිතියේ ප්‍රධාන කාර්යාලය අසළ දෙනියාය දෙසට ඇති බෝක්කුව සිට, මොරවක දෙසට වරල්ල ආදහනාගාරය අසළ මොරවක දෙසට ඇති බෝක්කුව දක්වා කිලෝ මීටර් 3.3 ක් වූ දෙනියාය අකුරැස්ස ප්‍රධාන මාර්ගයේ මධ්‍ය රේඛාවේ සිට බස්නාහිරට මීටර් 100 ක් දක්වා සහ නැගෙනහිරට මීටර් 100ක් දක්වා පිහිටි සියලු නිශ්චල දේපළ ඇතුළත්ව භූමිය කොටපොළ A දියුණු කළ ප්‍රදේශය ලෙස පෙන්වා දේ.

- මෙම භූමි ප්‍රදේශය කොටපොළ උතුර සහ කොටපොළ දකුණ යන ග්‍රාම නිලධාරි වසම් තුළ පිහිටා ඇත.

- මින් මොරවක් කෝරලේ තේ නිපදවන්නන්ගේ සමුපකාර සමිතියේ ප්‍රධාන කාර්යාලය අසළ දෙනියාය දෙසට ඇති බෝක්කුව සිට කොටපොළ ජාතික පාසල අසල මංසංදිය දක්වා මීටර් 600 ක දුර දෙනියාය අකුරැස්ස ප්‍රධාන මාර්ගයේ මධ්‍ය රේඛාවේ සිට බස්නාහිරට මීටර් 100 ක් දක්වා සහ නැගෙනහිරට මීටර් 100 ක් දක්වා පිහිටි සියලු නිශ්චල දේපළ ඇතුළත්ව භූමි කොටපොළ උතුර ග්‍රාම නිලධාරි වසමට අයත් වේ.

- කොටපොළ ජාතික පාසල අසල මංසංදිය සිට මොරවක දෙසට වරල්ල ආදාහනාගාරය අසළ මොරවක දෙසට ඇති බෝක්කුව දක්වා කිලෝමීටර් 2.7 ක දුර දෙනියාය අකුරැස්ස ප්‍රධාන මාර්ගයේ මධ්‍ය රේඛාවේ සිට බස්නාහිරට මීටර් 100 ක් දක්වා සහ නැගෙනහිරට මීටර් 100 ක් දක්වා පිහිටි සියළු නිශ්චල දේපළ ඇතුළත්ව භූමිය කොටපොළ දකුණ ග්‍රාම නිලධාරි වසමට අයත් වේ.

කොටපොළ A දියුණු කළ ප්‍රදේශය




02-807

# විවිධ දැන්වීම්

## හඟුරන්කෙත ප්‍රාදේශීය සභාව

2024 වර්ෂය සඳහා පළ වූ වරිපනම් බදු පැනවීමේ ගැසට් නිවේදනය සංශෝධනය කිරීම

ඉහත කරුණට අදාළව 2023.11.24 අංක 2360 දරන ගැසට් පත්‍රයේ පිටු අංක 09 හි 11-527/4 යටතේ පළ කරන ලද වරිපනම් බදු පැනවීම පිළිබඳ ගැසට් නිවේදන යෝජනාව පහත පරිදි සංශෝධනය කරන බව මෙයින් නිවේදනය කරමි.

**2024 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම**

*යෝජනාව*

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ,

(අ) 146 වන වගන්තියේ 1 වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර හඟුරන්කෙත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කරන ලද පහත අංක 1 උපලේඛනයේ සඳහන් ප්‍රදේශවල පිහිටි සෑම නිශ්චල දේපළකම වාර්ෂික වටිනාකම 2024 වර්ෂයට සකස් කරන ලද මධ්‍යම පළාත් තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරුකරුගේ අංක NE/302/RA/2023 හා 2023.11.27 දිනැති තක්සේරු ප්‍රතිශෝධනය අනුව වාර්ෂික වටිනාකම 2024 වර්ෂයේ වාර්ෂික වටිනාකම ලෙස පිළිගැනීමට,

(ආ) 134 වගන්තියේ 01 වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර හඟුරන්කෙත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කරන ලද පහත අංක 1 උපලේඛනයේ සඳහන් ප්‍රදේශ තුළ කුඹුරු ඉඩම් හැර පිහිටි සෑම නිශ්චල දේපළකම වාර්ෂික වටිනාකමින් ඉදිරියෙන් දක්වා ඇති ප්‍රතිශතයෙන් යුත් වරිපනම් බද්දක් පනවා අය කිරීමට, සහ

(ඇ) 134 වගන්තියේ (6) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර යථෝක්ත වාර්ෂික වරිපනම් බද්ද 2024 මාර්තු මස 31, ජුනි මස 30, සැප්තැම්බර් මස 30, දෙසැම්බර් මස 31 යන දින වලින් අවසන් කාර්තු හතර තුළදී සමාන වාරික හතරකින් ප්‍රාදේශීය සභාවට ගෙවනු ලැබිය යුතු යැයි විධාන කිරීමට හඟුරන්කෙත ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

අංක 01 උපලේඛනය

| *අනු අංකය* | *දියුණු කළ ප්‍රදේශ* | *ප්‍රතිශතය ගෘහස්ථ හා ව්‍යාපාරික* |
|---|---|---|
| 01. | හඟුරන්කෙත | 7% |
| 02 | රිකිල්ලගස්කඩ | 7% |
| 03. | හේවාහැට | 7% |

සී. පී. කේ. දිනපූර්ණ,
ලේකම්,
හඟුරන්කෙත ප්‍රාදේශීය සභාව.

2024 පෙබරවාරි මස 08 වැනි දින.

02-732

## තලවාකැලේ ලිඳුල නගර සභාව

නගර සභා ආඥාපනතේ (255 අධිකාරය)

නගර සභා ආඥාපනතේ (255 අධිකාරය) 1979 අංක 42 දරන මහ නගර සභා (සංශෝධිත) පනතින් හා සංශෝධිත නගර සභා පනතේ 164(1), 164 (2), 165 (අ), 165(ඇ), 165(ඈ) වගන්ති යටතේ තලවාකැලේ ලිඳුල නගර සභාව පහත උපලේඛනයෙන් දක්වා ඇති පරිදි බලපත්‍ර ගාස්තු හා බදු 2024 වර්ෂයට පනවා අයකිරීමට 2023.11.22 වැනි දින පැවති කළමනාකරණ කමිටු රැස්වීමේ දී තීරණ අංක 62 අනුව තීරණය කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ. එම වර්ෂය සඳහා බලපත්‍ර ගාස්තු හා බදු එම වර්ෂයේ මාර්තු 31 වෙනි දිනට පෙර ගෙවිය යුතු බව වැඩිදුරටත් මෙයින් නිවේදනය කරමි. මෙම පනවා ඇති බලපත්‍ර ගාස්තු හා බදුවලට අමතරව රජය විසින් පනවනු ලබන අනෙකුත් බදු වර්ග ද අයකරනු ලැබේ.

වයි. පී. විජේවර්ධන,
ලේකම්, (වැ.බ.),
තලවාකැලේ ලිඳුල නගර සභාව.

2023 දෙසැම්බර් මස 01 වැනි දින,
තලවාකැලේ ලිඳුල නගර සභා කාර්ලයාලයේ දී ය.

### උපලේඛනය අංක 01

නගර සභා ආඥාපනතේ (255 වැනි අධිකාරය) 164, 165අ වගන්තියට යටත්ව පනවන ලද බලපත්‍ර ගාස්තු :

වෙළඳ බලපත්‍ර ලබා ගත යුතු ව්‍යාපාර :

| *අනු. අංකය* | *ව්‍යාපාරය* | *වාර්ෂික වටිනාකම රු. 750 - රු. 1,000 දක්වා රු. ශත* | *වාර්ෂික වටිනාකම රු. 1,001 සිට රු. 1,500 දක්වා රු. ශත* | *වාර්ෂික වටිනාකම රු.1,501ට වැඩි රු. ශත* |
|---|---|---|---|---|
| 1. | බේකරියක් පවත්වාගෙන යාම | 1,000 0 | 2,000 0 | 3,000 0 |
| 2. | බත් කඩයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 3. | තේ හෝ කෝපි කඩයක් පවත්වාගෙන යාම | 500 0 | 660 0 | 1,000 0 |
| 4. | හෝටලයක් හෝ රෙස්ටුරන්ට් පවත්වාගෙන යාම | 1,000 0 | 2,000 0 | 3,000 0 |
| 5. | ලැගුම්හලක් පවත්වාගෙන යාම | 1,000 0 | 2,000 0 | 3,000 0 |
| 6. | බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම | 1,000 0 | 2,000 0 | 3,000 0 |
| 7. | මාළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 2,000 0 | 3,000 0 |
| 8. | කිරි එකතු කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 1,000 0 | 2,000 0 | 1,000 0 |
| 9. | එළවළු වෙළඳාම | 1,000 0 | 2,000 0 | 3,000 0 |
| 10. | පළතුරු වෙළඳසලක් පවත්වාගෙන යාම | 1,000 0 | 2,000 0 | 3,000 0 |
| 11. | අයිස්ක්‍රීම්/යෝගට් වෙළඳාම නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 1,000 0 | 2,000 0 | 3,000 0 |
| 12. | කිරි ආහාර නිෂ්පාදනය/වෙළදාම් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 1,000 0 | 2,000 0 | 3,000 0 |
| 13. | ලොන්ඩරියක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 14. | කෑම වර්ග නිෂ්පාදනය කර පැකට් කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 15. | බීම වර්ග රස කැවිලි විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 16. | මස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 1,000 0 | 2,000 0 | 3,000 0 |
| 17. | උත්සව ශාලාවක් පවත්වාගෙන යාම | 1,000 0 | 2,000 0 | 3,000 0 |

| *අනු. අංකය* | *ව්‍යාපාරය* | *වාර්ෂික වටිනාකම රු. 750 - රු. 1,000 දක්වා රු. ශත* | *වාර්ෂික වටිනාකම රු. 1,001 සිට රු. 1,500 දක්වා රු. ශත* | *වාර්ෂික වටිනාකම රු.1,501ට වැඩි රු. ශත* |
|---|---|---|---|---|
| **අන්තරායදයක වෙළඳාම :** | | | | |
| 18. | කබොක් ගල් හෝ කළුගල් ගබඩා කිරීම හෝ වෙළඳාම් කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 19. | සිසිල් බීම නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කිරීම | 1,000 0 | 2,000 0 | 3,000 0 |
| 20. | ගැලුම් 50 ට වැඩි පොල්තෙල් ගබඩා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 21. | පොල්තෙල් හැර වෙනත් තෙල් වර්ග ගබඩා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 22. | ග්‍රොස් 10 ට වැඩි ආරක්ෂා සහිත ගිනි පෙට්ටි ගබඩා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 23. | ගඩොල් උළු ගබඩා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 24. | පරණ ඇඳුම් ගබඩා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 25. | ස්වර්ණාභරණ නිෂ්පාදනය හෝ අලුත්වැඩියාව | 1,000 0 | 2,000 0 | 3,000 0 |
| 26. | යන්ත්‍රානුසාරයෙන් ලී මෝලක් පවත්වාගෙන යාම | 1,000 0 | 2,000 0 | 3,000 0 |
| 27. | යාන්ත්‍රික වඩු මඩුවක් පවත්වාගෙන යාම | 1,000 0 | 2,000 0 | 3,000 0 |
| 28. | දූව හෝ ඉරූ දූව ගබඩා කිරීම | 1,000 0 | 2,000 0 | 3,000 0 |
| 29. | දර ගබඩා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 30. | කම්හලක් පවත්වාගෙන යාම | 1,000 0 | 2,000 0 | 3,000 0 |
| 31. | හිස් බෝතල්, පරණ ගෝනි, යකඩ සුන්බුන් ගබඩා කිරීම | 1,000 0 | 2,000 0 | 3,000 0 |
| 32. | පාවිච්චි කරන ලද හෝ අලුත් ටයර් ටියුබ් ගබඩා කිරීම හෝ වෙළඳාම | 1,000 0 | 2,000 0 | 3,000 0 |
| 33. | යතුරුපැදි, පාපැදි, ත්‍රිරෝද රථ අළුත්වැඩියාව | 1,000 0 | 2,000 0 | 3,000 0 |
| 34. | සත්ත්ව ආහාර විකිණීම හෝ ගබඩා කර තැබීම | 500 0 | 750 0 | 1,000 0 |
| 35. | වාහන පින්තාරු කිරීම | 1,000 0 | 2,000 0 | 3,000 0 |
| 36. | මුද්‍රණාලයක් පවත්වාගෙන යාම | 1,000 0 | 2,000 0 | 3,000 0 |
| 37. | ආහාර වර්ග ගබඩා කිරීම හෝ වෙළඳාම් කිරීම | 1,000 0 | 2,000 0 | 3,000 0 |
| 38. | සිමෙන්ති ගබඩා කිරීම (කොට්ට 50 ට වැඩි) | 1,000 0 | 2,000 0 | 3,000 0 |
| **අප්‍රසන්න ව්‍යාපාර :** | | | | |
| 39. | පොහොර නිෂ්පාදනය විකිණීම හෝ කෘෂි රසායන ද්‍රව්‍ය විකිණීම | 1,000 0 | 2,000 0 | 3,000 0 |
| 40. | අවමංගල්‍ය භාණ්ඩ නිපදවීම හෝ වෙළඳාම් කිරීම | 1,000 0 | 2,000 0 | 3,000 0 |
| 41. | ඔක්සිජන් භාවිතයෙන් වෑල්ඩින් කිරීම | 500 0 | 660 0 | 1,000 0 |
| 42. | ලේත් වැඩපලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 43. | තේ කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම | 1,000 0 | 2,000 0 | 3,000 0 |
| 44. | ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම | 1,000 0 | 2,000 0 | 3,000 0 |
| 45. | ශීතකරණ ලද කුකුල් මස් හෝ මාළු විකිණීම | 500 0 | 750 0 | 3,000 0 |
| 46. | සිමෙන්ති භාණ්ඩ නිෂ්පාදනය හෝ විකිණීම හා බිලොක්ගල් වැඩපළක් පවත්වාගෙන යාම | 1,000 0 | 2,000 0 | 3,000 0 |
| 47. | ටයර් ටියුබ් වෝලකනයිසින් කිරීම හෝ අලුත්වැඩියා කිරීම | 1,000 0 | 2,000 0 | 3,000 0 |
| 48. | ධාන්‍ය වර්ග හෝ මිරිස් ඇඹරුම්හලක් පවත්වාගෙන යාම | 1,000 0 | 2,000 0 | 3,000 0 |
| 49. | තීන්ත වර්ණ වාර්නිෂ් වර්ග ගබඩා කිරීම හෝ විකිණීම | 1,000 0 | 2,000 0 | 3,000 0 |
| 50. | හුණු ගල් හෝ හුණු ගබඩා කිරීම හෝ විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 51. | රස කැවිලි නිෂ්පාදනය | 500 0 | 750 0 | 1,000 0 |
| 52. | වඩු මඩුවක් පවත්වාගෙන යාම | 1,000 0 | 2,000 0 | 3,000 0 |
| 53. | ගෘහ භාණ්ඩ නිපදවීම හෝ විකිණීම | 1,000 0 | 2,000 0 | 3,000 0 |
| 54. | කුකුල් ගොවිපලක් පවත්වාගෙන යාම | 1,000 0 | 2,000 0 | 3,000 0 |

| අනු. අංකය | ව්‍යාපාරය | වාර්ෂික වටිනාකම රු. 750 - රු. 1,000 දක්වා රු. ශත | වාර්ෂික වටිනාකම රු. 1,001 සිට රු. 1,500 දක්වා රු. ශත | වාර්ෂික වටිනාකම රු.1,501ට වැඩි රු. ශත |
|---|---|---|---|---|
| | **අප්‍රසන්න හා අන්තරාදායක වෙළඳාම :** | | | |
| 55. | හුණු ගල් පිළිස්සීම හෝ ගබඩා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 56. | ගිනිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා විකිණීම | 1,000 0 | 2,000 0 | 3,000 0 |
| 57. | බැටරි චාජ්කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 58. | වැල්ඩින් වැඩපළක් පවත්වාගෙන යාම | 1,000 0 | 2,000 0 | 3,000 0 |
| 59. | වාහන අලුත්වැඩියා කිරීම හෝ සර්විස් කිරීම | 1,000 0 | 2,000 0 | 3,000 0 |
| 60. | ටින්කර් වැඩපළක් පවත්වාගෙන යාම | 1,000 0 | 2,000 0 | 3,000 0 |
| 61. | කෘෂි රසායන බෙහෙත් වර්ග නිෂ්පාදනය හා විකිණීම | 1,000 0 | 2,000 0 | 3,000 0 |
| 62. | ශීතකරණ හෝ අධිශීතකරණ අලුත්වැඩියා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 63. | ක්ලච් ප්ලේට් නැවත අලවන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 64. | විදුලි උපකරණ හෝ ගුවන් විදුලි යන්ත්‍ර අලුත්වැඩියා කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 65. | ගෑස් විකිණීමේ ස්ථානයක් හෝ සිලින්ඩර් 50 ට වැඩි ගබඩාකිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 1,000 0 | 2,000 0 | 3,000 0 |
| 66. | බිම්මල් වගාව | 500 0 | 750 0 | 1,000 0 |
| 67. | විසිතුරු මල්පැළ හෝ තවානක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 68. | වාහන සේදීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 69. | බුලත්, පුවක් වෙළඳාම | 1,000 0 | 2,000 0 | 3,000 0 |
| 70. | ඉන්ධන පිරවුම්හලක් පවත්වාගෙන යාම | 1,000 0 | 2,000 0 | 3,000 0 |
| 71. | ඩීසල්, පෙට්‍රල් හා ඛණිජ තෙල් ගබඩා කිරීම | 1,000 0 | 2,000 0 | 3,000 0 |

**උපලේඛන අංක 02**

**නගර සභා ආඥාපනතේ (255 වන අධිකාරය) 165 අ 165අඅ වගන්ති යටතේ පනවනු ලැබූ වෙළෙඳ බද්ද :**

| | | | | |
|---|---|---|---|---|
| 1. | සිගරට් ඒජන්සියක් පවත්වාගෙන යාම | 1,000 0 | 2,000 0 | 3,000 0 |
| 2. | මෝටර් රථ අමතර කොටස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 1,000 0 | 2,000 0 | 3,000 0 |
| 3. | යතුරු පැදි අමතර කොටස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 1,000 0 | 2,000 0 | 3,000 0 |
| 4. | පාපැදි අමතර කොටස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 1,000 0 | 2,000 0 | 3,000 0 |
| 5. | ත්‍රිරෝද රථ අමතර කොටස් වෙළඳාම | 1,000 0 | 2,000 0 | 3,000 0 |
| 6. | ශීතකරණ හෝ අධිශීතකරණ යන්ත්‍ර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 1,000 0 | 2,000 0 | 3,000 0 |
| 7. | ගුවන් විදුලි යන්ත්‍ර රූපවාහිනී යන්ත්‍ර විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 1,000 0 | 2,000 0 | 3,000 0 |
| 8. | පැතලි වීදුරු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 9. | ආයුර්වේද බෙහෙත් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 10. | මත්පැන් වෙළඳාම (බලපත්‍ර ලත්) | 1,000 0 | 2,000 0 | 3,000 0 |
| 11. | යතුරුපැදි විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 1,000 0 | 2,000 0 | 3,000 0 |
| 12. | පාවහන් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 1,000 0 | 2,000 0 | 3,000 0 |
| 13. | පරිගණක හෝ පරිගණක අමතර කොටස් විකිණීමේ ස්ථානයක් | 1,000 0 | 2,000 0 | 3,000 0 |
| 14. | ගොඩනැගිලි ද්‍රව්‍ය විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 1,000 0 | 2,000 0 | 3,000 0 |
| 15. | ශබ්ද විකාශන යන්ත්‍ර කුළියට දීමේ ස්ථාන | 500 0 | 750 0 | 1,000 0 |
| 16. | දන්ත ශල්‍යාගාරයක් පවත්වාගෙන යාම | 1,000 0 | 2,000 0 | 3,000 0 |
| 17. | රෙදිපිළි වෙළඳාම | 1,000 0 | 2,000 0 | 3,000 0 |
| 18. | ඔරලෝසු අලුත්වැඩියාව හෝ විකිණීම | 500 0 | 750 0 | 1,000 0 |
| 19. | නාන කාමර කට්ටල හා පිඟන් ගඩොල් නිෂ්පාදන අලෙවි සලක් පවත්වාගෙන යාම | 1,000 0 | 2,000 0 | 3,000 0 |

| අනු. අංකය | ව්‍යාපාරය | වාර්ෂික වටිනාකම රු. 750 - රු. 1,000 දක්වා රු. ශත | වාර්ෂික වටිනාකම රු. 1,001 සිට රු. 1,500 දක්වා රු. ශත | වාර්ෂික වටිනාකම රු.1,501ට වැඩි රු. ශත |
|---|---|---|---|---|
| 20. | ලිපිද්‍රව්‍ය, පොත් සාප්පුවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 21. | රත්තරන් නොවන ආභරණ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 22. | පින්තූර රාමු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 23. | පරිගණක මුද්‍රණ හෝ ස්ක්‍රීන් මුද්‍රණ ස්ථානයක් පවත්වාගෙන යාම | 1,000 0 | 2,000 0 | 3,000 0 |
| 24. | ප්ලාස්ටික්/පොලිතීන්/රබර් භාණ්ඩ විකිණීමේ ස්ථාන | 500 0 | 750 0 | 1,000 0 |
| 25. | ඉංග්‍රීසි බෙහෙත් හලක් පවත්වාගෙන යාම | 1,000 0 | 2,000 0 | 3,000 0 |
| 26. | පුවත්පත්/සඟරා විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 27. | සංයුක්ත තැටි කුලියට දීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 28. | කුලියට ඇඳුම් සැපයීමේ ස්ථාන | 1,000 0 | 2,000 0 | 3,000 0 |
| 29. | රෙකෝඩ්බාර් එකක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 30. | කුෂන් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 1,000 0 | 2,000 0 | 3,000 0 |
| 31. | බට කුඩ විකිණීමේ ස්ථාන | 500 0 | 750 0 | 1,000 0 |
| 32. | උපලේඛන අංක 01 හා 02හි සඳහන් නොවන අනෙකුත් ව්‍යාපාර | 1,000 0 | 2,000 0 | 3,000 0 |
| 33. | දුරකථන ඇමතුම් ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 34. | දේශීය බෙහෙත් ශාලාවක් පවත්වාගෙන යාම | 1,000 0 | 2,000 0 | 3,000 0 |
| 35. | ඡායා පිටපත් මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 36. | තෑගි භාණ්ඩ හා විසිතුරු භාණ්ඩ අලෙවිසැලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 37. | විදුලි උපකරණ විකිණීමේ ස්ථාන | 1,000 0 | 2,000 0 | 3,000 0 |
| 38. | සිනමා ශාලාවක් පවත්වාගෙන යාම | 1,000 0 | 2,000 0 | 3,000 0 |
| 39. | නාමපුවරු හා දැන්වීම් පුවරු ස්ථාන පවත්වාගෙන යාම | 1,000 0 | 2,000 0 | 3,000 0 |
| 40. | රේස් ඔට්ටු පළක් පවත්වාගෙන යාම | 1,000 0 | 2,000 0 | 3,000 0 |
| 41. | උත්සව සමයේ තාවකාලික වෙළෙඳසැලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 42. | තේ කුඩු විකිණීමේ ස්ථාන | 1,000 0 | 2,000 0 | 3,000 0 |
| 43. | ජංගම දුරකථන විකිණීම | 1,000 0 | 2,000 0 | 3,000 0 |
| 44. | ජංගම දුරකථන සඳහා පෙරගෙවුම් කාඩ්පත් විකිණීම/රීලෝඩ් කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 45. | රූපලාවන්‍යාගාරයක් පවත්වාගෙන යාම | 1,000 0 | 2,000 0 | 3,000 0 |

ප්‍රදේශය තුළ පවත්වාගෙන යනු ලබන වෙළඳ ව්‍යාපාර හා වෘත්තීන් සම්බන්ධයෙන් වූ බද්දට (නගර සභා පනතේ 165 ආ යටතේ) පනතේ සඳහන් වෙළඳාම් හා වෘත්තීන් ඇතුළත් කළ යුතු බවත්, ඒ සඳහා නියමිත බද්ද අය කිරීමටත් තීරණය විය.

නගර සභා ආඥාපනතේ (255 වැනි අධිකාරය) 165 ආ වගන්තිය යටතේ පනවන ලද ව්‍යාපාරික බදු ගෙවිය යුතු වර්ෂයට පූර්ව වර්ෂයේ ව්‍යාපාර ලැබීම් පහත විස්තර කෙරෙන අනුපාතයන් නොඉක්මවා පවතින විටදී ගෙවිය යුතු බද්ද :

| 2023 වසරේ ව්‍යාපෘතියේ ආදායම | ගෙවිය යුතු බද්ද රු. ශත |
|---|---|
| රු. 6,000 නොඉක්මවන අවස්ථාවක | අය කිරීමක් නැත |
| රු. 6,001 ඉක්මවන නමුත් රු. 12,000 නොඉක්මවන විට | 90 0 |
| රු. 12,001 ඉක්මවන නමුත් රු. 18,750 නොඉක්මවන විට | 180 0 |
| රු. 18,751 ඉක්මවන නමුත් රු. 75,000 නොඉක්මවන විට | 360 0 |
| රු. 75,001 ඉක්මවන නමුත් රු. 1,50,000 නොඉක්මවන විට | 1,200 0 |
| රු. 1,50,001 ඉක්මවන විට දී | 3,000 0 |

01 මුදල් ණයට දෙන්නන්
02 උකස්කරුවන්
03 රක්ෂණ නියෝජිතයින්
04 පෞද්ගලික අධ්‍යාපන ආයතන
05 රියදුරු පුහුණු පාසලක් පවත්වාගෙන යාම
06 පෞද්ගලික විගණන ආයතන පවත්වාගෙන යාම
07 විදේශ රැකියා ආයතනයක් පවත්වාගෙන යාම
08 පෞද්ගලික නියෝජිත තැපැල් කාර්යාලයක් පවත්වාගෙන යාම
09 වෛද්‍ය විශේෂඥ සේවා මධ්‍යස්ථානයක් හා රසායනාගාර ස්ථානයක් පවත්වාගෙන යාම
10 ගොඩනැගිලි සැළසුම් සේවා මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
11 ගොඩනැගිලි ඉදිකිරීමේ කොන්ත්‍රාත්කරුවන්
12 පෞද්ගලික මිනින්දෝරු ආයතනයක් පවත්වාගෙන යාම
13 පරිගණක පුහුණු කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
14 වෙන්දේසිකරුවන් හා බ්‍රෝකර්වරුන්
15 ඉදිකිරීමේ කොන්ත්‍රාත්කරුවන්
16 වෙළඳ නියෝජිත ආයතන පවත්වාගෙන යාම
17 මුදල් හුවමාරු කිරීමේ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
18 ප්‍රවාහන සේවාවන් පවත්වාගෙන යාම
19 ලීසිං ආයතනයක් පවත්වාගෙන යාම
20 රැකියා වෙළඳපොළක් පවත්වාගෙන යාම
21 දන්ත ශල්‍යාගාරයක් පවත්වාගෙන යාම
22 අවමංගල්‍ය භාණ්ඩ නිපදවීම හෝ වෙළඳාම් කිරීම හා සේවා සැපයීම
23 උත්සව ශාලාවක් පවත්වාගෙන යාම
24 කිරි ආහාර නිෂ්පාදනය හා වෙළඳාම් කිරීම
25 ලොතරැයිපත් අලෙවි නියෝජිත ආයතනයක් පවත්වාගෙන යාම
26 රූපලාවන්‍යාගාරයක් පවත්වාගෙන යාම
27 ඇඟලුම් කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම
28 සිමෙන්ති භාණ්ඩ නිෂ්පාදනය හෝ විකිණීම
29 ඉන්ධන පිරවුම්හලක් පවත්වාගෙන යාම
30 පෙට්‍රල්, ඩීසල් හෝ ඛනිජ තෙල් ගබඩා කිරීම

**සේවා සඳහා අය කිරීම් :**

නගර සභා ආඥාපනතේ 160 (3) වගන්තිය යටතේ තලවාකැලේ ලිඳුල නගර සභා බල ප්‍රදේශයේ හා බල ප්‍රදේශයෙන් බැහැර මහජනතාව සඳහා ලබා දෙන සේවාවන් වෙනුවෙන් පහත සඳහන් ගාස්තු තීරණය කරන ලදී.

| *අනු. අංකය* | *විස්තරය* | *නගර සභා බල ප්‍රදේශයේ සීමාව ඇතුළත (රු.)* | *නගර සභා බල ප්‍රදේශයේ සීමාව පිටත (රු.)* |
|---|---|---|---|
| 01 | ගලිරථ සේවා ගාස්තු (දුර අනුව ගාස්තු හැර) | 7,000 0 | 9,000 0 |
| | ආගමික ස්ථාන සඳහා | 3,000 0 | 3,000 0 |
| | කිලෝමීටර එකක් දුර සඳහා ගාස්තුව | 150 0 | 150 0 |
| 02. | ආදාහනාගාරය | 20,000 0 | 26,000 0 |
| 03. | ජල බවුසරය | 3,000 0 | 3,500 0 |

| | |
|---|---|
| | *රු. ශත* |
| ගලි රථ ආදාහනාගාර හා ජල බවුසර් සඳහා අයදුම්පත් ගාස්තු | 100 0 |
| ගොඩනැගිලි අයදුම්පත් ගාස්තු නේවාසික | 1,000 0 |
| ව්‍යාපාරික | 3,000 0 |
| වීදි රේඛා හා නොපවරා ගැනීමේ සහතිකයක් සඳහා | 3,000 0 |
| වරිපනම් ලේඛනයේ නම සංශෝධනය කිරීම සඳහා | 1,000 0 |
| ATD පෝරම ගාස්තුව | 500 0 |
| අලෙවි ප්‍රවර්ධන කටයුතු සඳහා දිනකට | 5,000 0 |
| අනුකූලතා සහතික සඳහා | 5,000 0 |
| තාවකාලික බැනර් හා බෝඩ් සඳහා (වර්ග අඩියකට) | 20 0 |
| කොම්පෝස්ට් 1 (කි. ග්‍රෑ) | 25 0 |
| ප්‍රචාරක දැන්වීම් පුවරුවක වර්ග අඩි 01 ක් සඳහා අය කරනු ලබන මුදල | 100 0 |

**නගර සභා ක්‍රීඩාංගනය වෙන් කිරීම :**

| *අනු. අංකය* | *විස්තරය* | *සාමාන්‍ය කටයුතු සඳහා (රු.)* | *සංදර්ශන කටයුතු සඳහා (රු.)* |
|---|---|---|---|
| 01 | තලවාකැලේ ක්‍රීඩාංගනය | 2,000 0 | 3,000 0 |
| 02 | ලිඳුල ක්‍රීඩාංගනය | 500 0 | 1,500 0 |

දේශපාලන රැස්වීම් සඳහා ක්‍රීඩාංගනය වෙන් කිරීම දිනකට රු. 10,000 0

ක්‍රිකට් තරගයක් සඳහා ක්‍රීඩාංගනය වෙන් කිරීම දිනකට රු. 4,000 0

02-777/1

---

## තලවාකැලේ ලිඳුල නගර සභාව

### 2024 වර්ෂය සඳහා සංවර්ධනය නොකළ ඉඩම් මත බදු පැනවීම

තලවාකැලේ ලිඳුල නගර සභාව විසින් 2023.11.22 වැනි දින පවත්වන ලද කළමනාකරණ කමිටු රැස්වීමේ දී තීරණ අංක 62 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

2024 වර්ෂය සඳහා පනවන ලද එම සංවර්ධනය නොකළ ඉඩම් මත බද්ද ඒ වර්ෂයේ මාර්තු 31 වැනි දිනට පෙර නගර සභා කාර්යාලයට ගෙවිය යුතු බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

වයි. පී. විජේවර්ධන,
ලේකම්, (වැ.බ.),
තලවාකැලේ ලිඳුල නගර සභාව.

2023 දෙසැම්බර් මස 01 වැනි දින,
තලවාකැලේ ලිඳුල නගර සභා කාර්ලයාලයේ දී ය.

**යෝජනාව**

255 වැනි අධිකාරය වන නගර සභා ආඥාපනතේ 160(ඇ) වැනි උප වගන්තියේ (1) වැනි උපවගන්තියේ (1) වැනි උපවගන්තිය අනුව නගර සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර තලවාකැලේ ලිඳුල නගර සභා බලප්‍රදේශය ඇතුළත පිහිටි යම් ඉඩමක් ගොඩනැගිලි ඉදි කිරීම සඳහා සුදුසුවන විටක හෝ ස්ථාවර *නැතහොත්*නිතිපතා ගොවිතැන් කිරීමට සුදුසුවන විටක හෝ යුක්තිසහගත වියදමකින්

ඒ ඉඩම එකී යම් කාර්යයන් සඳහා සංවර්ධනය කළහැකි විටෙක,

*(අ)* ඒ ඉඩමේ සත්‍ය වශයෙන්ම ගොඩනැගිල්ලට යටවී ඇති බිම් ප්‍රමාණය හා ඒ ඉඩමේ සම්පූර්ණ බිම් ප්‍රමාණය අතර ඇති අනුපාතය අඩකට අඩු නම් (50%) හෝ ,

*(ආ)* ඒ ඉඩමේ ගොඩනැගිලි කිසිවක් ඉදිකර නොමැති නම්,

*(ඇ)* ස්ථාවර *නැතහොත්* නිතිපතා කරන ගොවිතැනට ඒ ඉඩම යොදවා නැත්නම්,

ඒ ඉඩමේ භූමියේ ප්‍රාග්ධන අගයෙන් සියයට දශම පහකට (0.5%) නොවැඩි ප්‍රමාණයක බද්දක් නගර සභාවට ගෙවිය යුතුය.

02-777/2

---

## තලවාකැලේ ලිඳුල නගර සභාව

2024 වර්ෂයට වරිපනම් බදු පැනවීම

1. (255 වැනි අධිකාරය වන) නගර සභා ආඥාපනතේ 160 (3) වැනි වගන්ති යටතේ ඒ ඒ සීමා කිරීම්වලට යටත්ව තලවාකැලේ ලිඳුල නගර සභා සීමාව තුළ පිහිටි සියලුම දේපළ සඳහා 2023 වර්ෂයේ වාර්ෂික වටිනාකම 2024 වර්ෂයට ද බල පවත්වන බවත්, එම වාර්ෂික වටිනාකමින් ව්‍යාපාරික ස්ථාන සඳහා 15%ක් හා අනෙකුත් දේපළ සඳහා 21% ක වරිපනම් බද්දක් 2024 වර්ෂය වෙනුවෙන් තලවාකැලේ ලිඳුල නගර සභාව විසින් පනවා අය කිරීමට 2023.11.22 වැනි දින කළමනාකරණ කමිටු රැස්වීමේ දී තීරණ අංක 62 යටතේ තීරණය කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ. එම බදු පිළිවෙළින් මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 වැනි දිනයන් හෝ ඊට ප්‍රථම සමාන කොටස් හතරකින් (4) හෝ සම්පූර්ණයෙන් ගෙවිය යුතු බවත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

2. 1979 අංක 42 දරන මහ නගර සභා, නගර සභා (සංශෝධිත) පනතේ 12 වැනි වගන්තිය ප්‍රකාරව ඉහත සඳහන් වාර්ෂික බදු මුදල් සම්පූර්ණයෙන් පහත දැක්වෙන පරිදි ගෙවූ විට එහි දැක්වෙන වට්ටම් මුදල් අඩු කරනු ලබන බව ද දැනුම් දෙනු ලැබේ.

   *(අ)* 2024 ජනවාරි මස 31 වැනි දිනට හෝ ඊට පෙර මුළු වර්ෂයටම ගෙවිය යුතු වරිපනම් බදු ගෙවනු ලැබුවහොත් එම මුදලින් සියයට දහයක් (10%),

   *(ආ)* එම මුදල කොටස් වශයෙන් ගෙවන විට එම වරිපනම් බදු ගෙවිය යුතු කාල සීමාවේ පළමු මාසය තුළ ගෙවනු ලැබුවහොත් එසේ ගෙවනු ලබන මුදලින් සියයට පහක් (5%).

3. මෙහි පළමු වැනි ඡේදය ප්‍රකාර ගෙවිය යුතු බදු මුදල් නොගෙවන අයගේ සෑම ව්‍යාපාරික දේපළක් වෙනුවෙන් සියයට විස්සක (20%) හා අනෙකුත් සෑම ස්ථානයකින් ම සියයට පහළොවක (15%) වරෙන්තු ගාස්තු අයකරනු ලබන බව ද මෙයින් දැනුම් දෙනු ලැබේ.

වයි. පී. විජේවර්ධන,
ලේකම්, (වැ.බ.),
තලවාකැලේ ලිඳුල නගර සභාව.

2023 දෙසැම්බර් මස 01 වැනි දින,
තලවාකැලේ ලිඳුල නගර සභා කාර්යාලයේ දී ය.

02-777/3

## වවුනියාව උතුරු ප්‍රාදේශීය සභාව

### සතුන් වදහිංසා ආඥාපනත (පරිච්ඡේදය 272) 7 (2) වැනි කොටස යටතේ දැන්වීම් - 2024

වවුනියා උතුරු ප්‍රාදේශීය සභා බල ප්‍රදේශවල ප්‍රාදේශීය සභාවෙන් සමත් වූ බදුකරුවන්ට/කොන්ත්‍රාත්කරුවන්ට ලබා දුන් යම් කිසි මස් කඩවල් සතුන් වද හිංසා පනතේ (පරිච්ඡේදය 272) 17 (2) කොටස යටතේ මා හට දී ඇති බලතල අනුව ඉහත සඳහන්ව ඇති උපලේඛන අනුව දක්වා ඇති දිනවල රජයේ සම්මත වූ දිනවලත් මා විසින් වරින්වර දැනුවත් කරනු ලබන දිනවලත් සතුන් විකිණීම ද විකුණනු පිණිස එල්ලීමද මස් කඩවල් විවෘත කර තබා ගැනීම මුලින්ම වැළැක්විය යුතු බව මෙයින් දන්වා සිටිමි.

**උපලේඛනය**

1. ශ්‍රී ලංකා නිදහස් දිනය
2. මහා සිව රාත්‍රිය
3. වෙසක් පුර පසලොස්වක දිනය (රජයේ සම්මත වූ දිනවල්)
4. ලෝක සත්ත්ව දිනය
5. මාසේ පුර පසලොස්වක දින

සෝතිනායකි මණිවණ්ණන්,
ලේකම්,
වවුනියා උතුරු ප්‍රාදේශීය සභාව.

2023 දෙසැම්බර් මස 29 වැනි දින.

02 - 733/1

---

## වවුනියාව උතුරු ප්‍රාදේශීය සභාව

### ප්‍රචාරක දැන්වීම් ගාස්තු - 2024

1987 වර්ෂයේ ප්‍රාදේශීය සභා පනතේ 126-7 උෟ කොටස යටතේ බාර කළ උපමා අනුව 1988.08.23 වැනි දින 520/7 අති විශෙෂ චක්‍රලේඛනයේ පළාත් පාලන නිවාස හා නිර්මාණ ඇමතිතුමා විසින් ප්‍රසිද්ධ කළ (62 A, 63 A, 64 A පිටුවල 1998.04.17 වැනි දින අංක 1024 චක්‍රලේඛනයේ මා විසින් පිළිගත් ප්‍රචාරක දන්වීම් සම්බන්ධව අතුරු ව්‍යවස්ථා සැලැස්ම අනුව වවුනියා උතුරු ප්‍රාදේශීය සභාවේ බල ප්‍රදේශයක කවුරු හෝ වේවා යම් කිසි පාරක් හෝ පාරට දිග්ගැසුනු ප්‍රචාරක පුවරු *නැතහොත්* තාවකාලික සංවිධානාත්මක නැතහොත් විවිධ අලංකාරවල් ස්ථාපිත හෝ ස්ථාපිත කිරීමට සැලසුම් කිරීමට වවුනියා උතුරු ප්‍රාදේශීය සභාවේ අනුමැතිය ලබාගෙන මෙවැනි ස්ථිර ස්ථාපිත ප්‍රචාරවලට අවුරුදු පතා නියමිත ගාස්තු ගෙවා අලුත් කිරීම කරන ලෙස දැනුවත් කරමි.

| | | *රු. ශත* |
|---|---|---|
| 01. | බිත්තියක හෝ දැන්වීම් පුවරුවක ප්‍රදර්ශනයට තබන ස්ථිර ප්‍රචාරක දැන්වීම්වලට සෑම වර්ග අඩියකට එක් වර්ෂයකට හෝ එක් කොටසකට (නාම පුවරුවේ දෙපස දැන්වීම් ප්‍රදර්ශනයට තබා ඇත්නම් දෙපසට ගාස්තු අය කළ යුතු ය.) | 100 0 |
| 02. | බැනරයක් ප්‍රදර්ශනයට තබාගන්න තාවකාලික දැන්වීම් සෑම වර්ග අඩියකට හෝ එයින් කොටසකට | 50 0 |
| 03. | එක් ලෑල්ලක හෝ එක් උපකාරයක් සමග ප්‍රදර්ශනයට තබන විදුලි බුබුලු එළියක් සමග ඇති දැන්වීම්වලට සෑම වර්ග අඩියකටම එක් වර්ෂයකට හෝ එයින් කොටසකට | 150 0 |
| 04. | ස්ථිර ව්‍යාපාර ස්ථානවල දැන්වීම් සහිත ප්‍රදර්ශනය සඳහා වර්ග අඩියකට | 100 0 |
| 05. | වෙළඳ දැන්වීම් අයදුම්පත්‍ර ගාස්තු - | 100 0 |

සෝතිනායකි මණිවණ්ණන්,
ලේකම්,
වවුනියා උතුරු ප්‍රාදේශීය සභාව.

2023 දෙසැම්බර් මස 29 වැනි දින.

02 - 733/2

## වවුනියා උතුරු ප්‍රාදේශීය සභාව

ගොඩනැගිලි අනුමැතිය- 2024

ප්‍රාදේශීය සභාවේ පරිපාලන සීමාව තුළ 1987 වර්ෂයේ අංක 15 පරිපාලන සභා පනතේ කොටස් 47 සිට 59 දක්වා එක්ව නිවාස සංවර්ධන ආඥාපනත (පරිච්ඡේදය 600) පැවතුම් 1998.01.01 වැනි දින සිට අපගේ ප්‍රාදේශීය සභාවට ඔබින වන පරිදි පැවැත්ම අනුව මාහට ඇති බලතල ප්‍රකාරව 1987 වර්ෂයේ අංක 15 වැනි ප්‍රාදේශීය සභා පනතේ බලතල අනුව සභාවේ බල ප්‍රදේශය තුළ ගෙවල් සෑදීම හෝ වෙනත් ආයතන ඉදි කිරීමට ගොඩනැගිලි ඉදිකිරීම සඳහා ඉල්ලුම්පත් ඉදිරිපත් කරන විට එම පරීක්ෂණ වෙනුවෙන් අනෙකුත් දේවල් සම්බන්ධවත් පහත දක්වා ඇති උපලේඛනය අනුව 2024.01.01 සිට ගාස්තු අය කිරීම මෙයින් තීරණය කර ඇති බව ප්‍රකාශ කරමි.

### උපලේඛනය

| *අංක* | *විස්තර* | *2024 වර්ෂය සඳහා අයකිරීම් රු. ශත* |
|---|---|---|
| 01. | පදිංචි වී සිටින ස්ථානයට තාප්පයක් සෑදීම (වර්ග අඩි 3000 කට අඩු) | 1,250 0 |
| 02. | පදිංචි වී සිටින ස්ථානයට තාප්පයක් සෑදීම (වර්ග අඩි 3000 හා ඊට වැඩි) | 1,500 0 |
| 03. | ව්‍යාපාරික අවශ්‍යතාවයකට තාප්ප බැඳීම (වර්ග අඩි 3000 කට අඩු) | 1,500 0 |
| 04. | ව්‍යාපාරික අවශ්‍යතාවයකට තාප්ප බැඳීම (වර්ග අඩි 3000 හා ඊට වැඩි) | 2,000 0 |
| 05. | වර්ග අඩි 500 අඩු වාසය කරන නිවාස ගොඩනැගිලි | 1,200 0 |
| 06. | වර්ග අඩි 500 අඩු ව්‍යාපාර ගොඩනැගිලි | 1,300 0 |
| 07. | වර්ග අඩි 500 - 1,500 ඇතුලත වාසය කරන නිවාස ගොඩනැගිලි | 1,500 0 |
| 08. | වර්ග අඩි 500 - 1500 ඇතුලත ව්‍යාපාර ගොඩනැගිලි | 2,000 0 |
| 09. | වර්ග අඩි 1,500 - 2,500 ඇතුලත වාසය කරන නිවාස ගොඩනැගිලි | 1,700 0 |
| 10. | වර්ග අඩි 1,500 - 2,500 ඇතුලත ව්‍යාපාර ගොඩනැගිලි | 2,000 0 |
| 11. | වර්ග අඩි 2,500 ට වැඩි වාසය කරන ගොඩනැගිලි සඳහා වැඩියෙන් ඇති වර්ග අඩි 1000 සඳහා | 1,000 0 |
| 12. | වර්ග අඩි 2,500 වැඩි ව්‍යාපාර කරන ගොඩනැගිලි සඳහා වැඩියෙන් ඇති වර්ග අඩි 1000 සඳහා | 1000 0 |
| 13. | වාසය කරන ගොඩනැගිල්ල වෙනස් වුවත් බිම වෙනස් නොවන අවස්ථාවලදී | 500 0 |
| 14. | ව්‍යාපාර කරන ගොඩනැගිල්ල වෙනස් වුවත් බිම වෙනස් නොවන අවස්ථාවලදී | 1,000 0 |
| 15. | වාසය කරන ගොඩනැගිල්ලෙහි අනුමැතිය ලබා ගත් නමුත් එය ඉදි නොකරන අවස්ථාවලදී වර්ෂයකට | 500 0 |
| 16. | ව්‍යාපාර කරන ගොඩනැගිල්ලෙහි අනුමැතිය ලබා ගත් නමුත් එය ඉදි නොකරන අවස්ථාවලදී වර්ෂයකට | 800 0 |
| 17. | ව්‍යාපාර කරන ගොඩනැගිල්ලෙහි වැඩ අවසන් වූ පසුව ලබාදෙන සහතිකය සඳහා | 1,000 0 |
